# කොරියානු භාෂා පරීක්ෂණය නිවේදනය කිරීම

## පරිගණක ආශ්‍රිත පරීක්ෂණය CBT)

කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා අමාත්‍යාංශය අතර අත්සන් කරනු ලැබූ අවබෝධතා ගිවිසුම (MOU) ප්‍රකාරව රැඳිසිටීමට ලබාදී ඇති අවසරලත් කාලසීමාව තුළ ස්වකැමැත්තෙන් මෙරටට පැමිණ නැවත කොරියාවේ සේවය සඳහා පිටත්වීමට කැමැත්තක් දක්වන සේවකයන් සම්බන්ධයෙන් වන විශේෂ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (Special EPS – TOPIK) පහත පරිදි ශ්‍රී ලංකාවේදී පැවැත්වේ.

කොරියානු ජනරජයේ රැකියා කිරීමට බලාපොරොත්තු වන සේවකයින් කොරියාවේ මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් පවත්වන මෙම පරීක්ෂණය සමත්විය යුතුවේ. මෙම පරීක්ෂණය සමත්වන පුද්ගලයින්ට පමණක් රැකියා බලපත්‍ර ක්‍රමය(EPS) යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ හැකිවේ.

**01. පරීක්ෂණ කාලසටහන**

| ලියාපදිංචි කාලසීමාව | පරීක්ෂණ දිනය නිවේදනය | පරීක්ෂණ කාලසීමාව | ප්‍රතිඵල නිවේදනය | වයස් සීමාව |
|---|---|---|---|---|
| ජූලි 25 සිට ජූලි 27 දක්වා | අගෝස්තු 11 | අගෝස්තු 18 සිට | සැප්තැම්බර් 13 | 1976 ජූලි 26 සිට 1998 ජූලි 25 දක්වා |

* රැකියා බලපත්‍ර ක්‍රමයේ ස්වභාවයට අනුකූලව මෙම කාලසටහන වෙනස්විය හැක

- ○ පළමු සැසිය - පුද්ගලයින් 35
  - උපදෙස් ලබාදීම : පෙ.ව. 9.20 - පෙ.ව.10.00
  - පරීක්ෂණ වේලාව : පෙ.ව. 10.00 - පෙ.ව.11.10

  දෙවන සැසිය - පුද්ගලයින් 35
  - උපදෙස් ලබාදීම : ප.ව.12.20 - ප.ව.13.00
  - පරීක්ෂණ වේලාව : ප.ව. 13.00 - ප.ව. 14.10

- ○ තුන්වන සැසිය - පුද්ගලයින් 35
  - උපදෙස් ලබාදීම : ප.ව.14.20 - ප.ව.15.00
  - පරීක්ෂණ වේලාව ප.ව.15.00 - ප.ව. 16.10

✠ සියළුම අයදුම්කරුවන් උපදෙස් ලබාදීමේ රැස්වීමට පෙර පරීක්ෂණ ස්ථානයට පැමිණ සිටිය යුතුය

**02. කර්මාන්ත වර්ග - නිෂ්පාදන, කෘෂිකර්මාන්ත / පශු සම්පත්, ඉදිකිරීම්, ධීවර හා සේවා ක්ෂේත්‍රයන්**

※ අයදුම්කරුට තමා මව් රටට පැමිණීමට පෙර වසරකට වඩා වැඩි කාලයක් අවසන්වරට සේවය කළ රැකියා ස්ථානයම නිර්දේශ කරගැනීමට අවශ්‍ය නම් ඔහු /ඇය අයදුම්කිරීමේ දී අදාළ ක්ෂේත්‍රයම තෝරාගැනීමට සුපරීක්ෂාකාරී වියයුතුය.

**03. පරීක්ෂණය සමත් කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව - දැනුම්දීමට නියමිතය**

○ පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතුරින් රැකියා ක්ෂේත්‍රය නොසලකා මුළු ලකුණු 200න් 80ට වඩා ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු මට්ටම අනුව සමත්වන්නන් පිළිබඳව පසුව දැනුම්දෙනු ලැබේ.

4. පරීක්ෂණ ස්ථානය හා දිනය නිවේදනය

- **පරීක්ෂණ ස්ථානය - CBT පරීක්ෂණ ශාලාව - (පරිගණක ආශ්‍රිත පරීක්ෂණය)**
  නො 205, දෙපානම, පන්නිපිටිය

- **නිවේදන ක්‍රමවේදය**

  - EPS-TOPIK වෙබ් අඩවිය (http://www.epstopik.hrdkorea.or.kr)
  - කාර්යාංශ වෙබ් අඩවිය (http://www.slbfe.lk) හා කාර්යාංශ දැන්වීම් පුවරුව

**5. සුදුසුකම්**

- මූලික ගිවිසුම ප්‍රකාරව අවසරලත් කාලසීමාව තුළ ස්වේච්ඡාවෙන් (2010.01.01 දිනට පසුව) මව් රටට පැමිණෙන ශ්‍රමිකයින්

- වයස් සීමාව අවුරුදු 18 සහ 39 අතර
  (1976 ජූලි 26 සිට 1998 ජූලි 25 දක්වා කාලසීමාව තුළ උපත ලැබූවන්)

- අයදුම්කරුවන් සිරගතවීමක් හෝ ඊට වඩා වැඩි දඬුවමකට ලක්වී නොසිටීම

- අයදුම්කරුවන් සඳහා කොරියානු ජනරජයෙන් පිටුවහල් කිරීමේ හෝ පිටත්වීමේ නියෝග වාර්තාවක් නොතිබිය යුතුය. කොරියාවේ නීති විරෝධී ලෙස එක් දිනක් හෝ රැඳී නොසිටීම

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමේ තහනමකට ලක්නොවූවන් විය යුතුයි.

**6. අයදුම්පත් (ප්‍රවේශපත්‍ර) ලියාපදිංචි කිරීම.**

- කාලසීමාව :- 2016.07.25 සිට 2016.07.27 දක්වා (දින 03)
- ලියාපදිංචිය සිදුකරන ස්ථානය :- ශ්‍රවණාගාරය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, නො. 234, කොස්වත්ත, බත්තරමුල්ල
- ලියාපදිංචි ක්‍රමවේදය :- පෞද්ගලිකව පැමිණ ලියාපදිංචි විය යුතුය
- අයදුම්පත්‍ර නිකුත් කල හැකි අයදුම්කරුවන්ගේ නම් ලැයිස්තුව කාර්යාංශ වෙබ් අඩවියෙන් පරික්ෂා කල හැක. ((http://www.slbfe.lk)

- **අවශ්‍ය ලේඛන**

  - මව් රටට පැමිණීමට භාවිතා කල ගමන් බලපත්‍රයේ පිටපත් (ඔහු/ඇය ස්වේච්ඡාවෙන් පැමිණි අයකු බව තහවුරු කිරීම සඳහා)

  - අයදුම්පත්‍රය (ලියාපදිංචි කරනු ලබන ස්ථානයේ දී බෙදාදෙනු ලැබේ.)

  ※ එක් අයදුම්කරුවෙකුට එක් ප්‍රවේශපත්‍රයක් පමණක් නිකුත් කරනු ලබන අතර, ප්‍රවේශපත් අංකය එහි සඳහන් කර ඇත. එහි යම් දෝෂයක් සිදුවුවහොත් ටිපෙක්ස් භාවිතා කර නිවැරදි කර භාරදිය යුතුය

  - වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්

※ තම ගමන් බලපත්‍රයේ පිටපතක් අයදුම්පත සමඟ ඇමිණිය යුතුයි'

- **මාස 06 ක් ඇතුළත ලබාගත්** 3'5cm x 4'5cm ප්‍රමාණයේ පැහැදිලි වර්ණ ඡායාරූප 02ක්

※ අයදුම්කරු විසින් සිය අයදුම්පත්‍රයේ සඳහන් කරන පෞද්ගලික තොරතුරු ගමන් බලපත්‍රයේ ඇති තොරතුරු වලට සමාන විය යුතුය. එය සමාන නොවේනම් ඔහුට /ඇයට කොරියාවට ඇතුළු වීමට නොහැකි වේ. තොරතුරු සම්බන්ධ වෙනස්කම්වලට අයදුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතු වේ. එබැවින් ලියාපදිංචිය සඳහා පැමිණෙන විට අයදුම්කරුවන් සිය වලංගු විදේශ ගමන් බලපත්‍රයම රැගෙන ඒම අනිවාර්යය වේ.

※ අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් කරන නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ඡායාරූපය කොරියානු රැකියා ලබාදීමේ දී භාවිතා කරන බැවින් එම තොරතුරු පසුව කිසිසේත් වෙනස් කල නොහැක

○ විභාග ගාස්තු - ඇමෙරිකානු ඩොලර් 24කි. විභාගය සඳහා ලියාපදිංචි වන දිනට අදාළ විනිමය අනුපාතිකයට අනුව දේශීය මුදලින් (දළ වශයෙන් රු. 3552/= ක්) ගෙවිය යුතු වේ.

※ කිසියම් අයදුම්කරුවෙක් නොවැළැක්විය හැකි හේතුවක් නිසා තම විභාගයට පෙනී නොසිටින්නේ නම් ඔහුට / ඇයට විභාග ගාස්තු ලියාපදිංචි කාලය තුළ ආපසු ලබාගත හැකිය. (කෙසේ වුව ද අවලංගු කිරීමකින් පසුව නැවත ලියාපදිංචිය සඳහා ඉඩකඩ ලබාදෙනු නොලැබේ)

※ ලියාපදිංචිය අයදුම්කරුවන් පැමිණීමේ පිළිවෙල අනුව සිදුවන අතර, අයදුම්කරුවන්ගේ ප්‍රමාණය මත මත අමතර පරීක්ෂණ දිනයක් තීරණය කිරීම හා පරීක්ෂණය පැවැත්වීම සිදුකරනු ලබයි. පරීක්ෂණය පැවැත්වෙන බව නිවේදනය කරනු ලබන දින එක් එක් අයදුම්කරුවන්ට අදාළව පරීක්ෂණ ස්ථානය, පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු දිනය හා වේලාව www.slbfe.lk වෙබ් අඩවියෙන් සම්පූර්ණ නම ඇතුළත් කර ලබාගත හැකිය.

## 7. පරීක්ෂණ සැකැස්ම :

| ප්‍රශ්න ආකෘතිය | ප්‍රශ්න සංඛ්‍යාව | මුළු ලකුණු | කාලය |
|---|---|---|---|
| කියවීම | 25 | 100 | මිනිතුත් 40 |
| සවන් දීම | 25 | 100 | මිනිත්තු 30 |
| මුළු ලකුණු | 50 | 200 | මිනිත්තු 70 |

○ පරීක්ෂණයේ ස්වභාවය

- බහුවරණ ප්‍රශ්න පත්‍රය
- (විවේක කාලයකින් තොරව සවන්දීමේ හා කියවීමේ විභාගය පැවැත්වේ)

○ සියළුම ප්‍රශ්ණ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා විෂය නිර්දේශ ආශ්‍රයෙන් සකසනු ලැබේ.

※ පරීක්ෂණ දිනයේ දී රැගෙන ආ යුතු දෑ

- ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුට ලබා දී ඇති කොටස

- ගුවන් ගමන් බලපත්‍රය

**(විභාග ප්‍රවේශපත්‍රය සඳහා භාවිතා කරන ලද ගමන් බලපත්‍රයම විය යුතුය. ඉදිරියට වලංගුව පවතින ගමන් බලපත්‍රය නොමැතිව කිසිදු අයදුම්කරුවෙකුට විභාගය සඳහා පෙනී සිටිය නොහැක)**

8. විභාග ප්‍රතිඵල නිවේදනය කිරීම

- දිනය - 2016 සැප්තැම්බර් 13 දින පහත සඳහන් වෙබ් අඩවිවල සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ
- දැනුම්දීමේ ක්‍රමය -
  - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ දැන්වීම් පුවරුව
  - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය (http://www.slbfe.lk)
  - කොරියානු භාෂා ප්‍රවීණතා විභාග වෙබ් අඩවිය (http://epstopik.hrdkorea.or.kr)
  - කොරියානු රැකියා පිළිබඳ වෙබ් අඩවිය http://www.eps.go.kr

※ ප්‍රතිඵල වලංගු කාල සීමාව - අවුරුදු දෙකයි (ප්‍රතිඵල නිකුත් වූ දින සිට වසර දෙකක කාලසීමාවකි)

9. වෙනත් තොරතුරු

- අයදුම්කරු ස්වේච්ඡාවෙන්ම රටට නොපැමිණි බව තහවුරුවීම මත ඔහු /ඇය පරීක්ෂණය සමත් වුව ද ඔහුගේ/ඇයගේ පරීක්ෂණ ප්‍රතිඵල අවලංගු ලෙස සලකන අතර, ඒ සම්බන්ධ සියළු වගකීම අයදුම්කරු සතු වේ.
- සමත්වන අයදුම්කරුවන් පෙර විගමණික පුහුණුවෙන් නිදහස්වන අතර, කෙටි කාලීන නැවත ඇතුළත් වීමේ ක්‍රමවේදයකට හා කඩිනම් රැකියා ලියාපදිංචියකට සුදුසුකම් ලබයි.
- විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී වංචා කිරීම සඳහා භාවිතා කළ හැකි ජංගම දුරකථන, කැසට් වාදන යන්ත්‍ර, MP3 වාදන යන්ත්‍ර PDA විද්‍යුත් ශබ්ද කෝෂ වැනි උපකරණ තමා සන්තකේ තබාගැනීම සපුරා තහනම් වේ.
- කිසියම් අයදුම්කරුවෙකු විසින් විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී ඒවා භාවිතා කරන ලද්දේ නම් ඔහුගේ /ඇයගේ ප්‍රතිඵල අවලංගු කරනු ලබන අතර වසර 02ක කාලයක් සඳහා අදාළ විභාග වෙනුවෙන් තහනමක් ද පමුණුවනු ලැබේ.
- අයදුම්කරුගේ විදේශ ගුවන් ගමන් බලපත්‍රයේ සඳහන් නම, උපන් දිනය සහ ස්ත්‍රී පුරුෂ භාවය වැනි පෞද්ගලික තොරතුරු සහ ඔවුන් විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන එකී තොරතුරු අතර අසමානකම් පැවතීම කොරියානු රැකියා වෙබ් අඩවියෙහි ලියාපදිංචි කිරීමට සහ කොරියාවට පිවිසීම ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බැවින් එවැනි වෙනස්කම් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම අයදුම්කරුවන් වෙත පැවරේ.

  කොරියානු භාෂා ප්‍රවීණතාව ඉහළ දැමීම සඳහා සියළුම බහුවරණ ප්‍රශ්ණ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා විෂය නිර්දේශිත පොතෙන් උපුටා ගැනීමට අපේක්ෂිතය.

කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා අදාළ වන විෂය නිර්දේශිත පොත පහතින් සඳහන් කරන අතර අයදුම්කරුවන් හට පහත සඳහන් වෙබ් අඩවි වලින් නොමිලේ බාගත හැකිය.

(විෂය නිර්දේශය බාගත හැකි වෙබ් අඩවිය)

| අංශය | අන්තර්ගතය | වෙබ් අඩවිය |
|---|---|---|
| HRD Korea | Textbookfile | http://www.hrdkorea.or.kr/3/3/3/1/2 |
| අඩවියේ මුල් පිටුව | PDF,Sound Source& | http://epstopik.hrdkorea.or.kr |

සැ.යු - කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සම්බන්ධයෙන් වන පරිගණකමය වෙබ් පිටුව

URL:epstopik.hrdkorea.or.kr ---- English home page ---- Experience

- **කොරියානු භාෂා විභාගය සමතවීම කොරියාවේ රැකියාවක් ලබාදීම සහතික නොකරන අතර, එය ඔබගේ රැකියා අයදුම්පත්‍රය ලියාපදිංචි කිරීමට සුදුසුකමක් පමණක් සලසනු ලැබේ.**

- වෛද්‍ය පරීක්ෂණය අසමත් වන හෝ කොරියාවේ නීති විරෝධි ලෙස සේවය කර ඇති අයදුම්කරුවන් කොරියාවේ රැකියා සඳහා අයදුම්කිරීමට සුදුසුකම් නොලැබෙන අයදුම්කරුවන් සේ සලකනු ලැබේ.

- දකුණු කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා අමාත්‍යාංශය අතර, අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පමණක් දකුණු කොරියාවට ශ්‍රී ලාංකිකයින් යැවීම සඳහා නීත්‍යානුකූල බලයක් ඇත.

- කොරියානු භාෂා විභාගය සමත් වී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් කොරියානු රැකියා වෙබ් අඩවියෙහි ලියාපදිංචි කරන ලද අයදුම්කරුවන් පමණක් කොරියානු රජයේ සේවා යෝජකයින් විසින් බඳවාගනු ලැබේ.

- වෙනත් කිසිම පෞද්ගලික අංශයක් කොරියාවේ රැකියා සඳහා යැවීමේ ක්‍රමයට මැදිහත් වන්නේ නම්, ඔවුන් සඳහා එවැනි ක්‍රියාවලට නීත්‍යානුකූලව දඩුවම් පවරනු ලැබේ.

- අදාළ අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් 24 (රු.3552/=) පමණක් අයදුම්කරු විසින් ශ්‍රීලංකා විදේශ සෙවා නියුක්ති කාර්යාංශය වෙත ගෙවාය යුතු අතර, මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු පාර්ශවයකට කිසිදු මුදලක් ගෙවීම සිදුනොකළ යුතු බව වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ. එමෙන්ම රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ කොරියානු රැකියා ලබාදීම හෝ ඒ හා සම්බන්ධ කිසිදු කරුණක් උදෙසා කිසිදු වංචනික පාර්ශ්වයකට හසු නොවන ලෙස දැනුම් දෙනු ලැබේ.

අධීක්ෂණය - කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය
පරිපාලනය - කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය
සහයෝගය - විදේශ රැකියා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය


**සභාපති**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

**234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල**

**දුරකථන අංක - 0112864101-105**

**0112880500**